# ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

## යුද්ධ හමුදාවේ පාවිච්චිකර අයෝග්‍ය කරන ලද රථවාහන/පොදුභාණ්ඩ විවෘත ටෙන්ඩර් මගින් විකිණීම.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ පාවිච්චියෙන් පසු අයෝග්‍ය කරන ලද පහත සඳහන් කර ඇති රථවාහන සහ පොදුභාණ්ඩ 2012.01.10 සහ 11 දින 1 රෙජි යුධෝපකරණ බලකාය - පනාගොඩ, හෝමාගමදි, 2012.01.10 දින (ශ්‍රීලංඉ ස්වාධීන වැඩපල මත්තේගොඩ ඇති පොදු භාණ්ඩ ) 1 රෙජි යුධෝපකරණ බලකාය පනාගොඩ - හෝමාගමදි හිදි 2012.01.16 සහ 17 දින 2 රෙජි යුධෝපකරණ බලකාය - රණසේවාපුර, අනුරාධපුරදි, 2012.01.18 දින 3 රෙජි යුධෝපකරණ බලකාය - මහසෙන්පුර, මින්නේරියේදි, සහ 2012.01.24 දින 5 රෙජි යුධෝපකරණ බළකාය කන්කසන්තුරය - යාපනය හිදි විවෘත ටෙන්ඩර් මගින් විකිණීමට ඉදිරිපත් කෙරේ.

**<u>රථවාහන</u>**

| | | |
|---|---|---|
| ට්‍රක්රථ | - | ටාටා 1210, ටාටා 1313, ඉසුසු, ඉසුසු TS ඉසුසු සුපර් ට්‍රක්, ඉසුසු FXR, මිට්සුබිසි කැන්ටර්, අශෝක් ලේලන්ඩ් කාගෝ,, කාගෝ 709, ඉසුසු NKR, ටොයෝටා 6000 ට්‍රක්, අශෝක් ලේලන්ඩ් කාගෝ 909, ස්කැමල් ටේලර්, අශෝක් ලේලන්ඩ් 909 |
| ලොරි | - | ඉසුසු, අශෝක් ලේලන්ඩ, මිට්සුබිෂි |
| බස්රථ | - | ටාටා 1210 එස්සි , ටාටා එල්පී 1210 ඊ52 බස්, ටාටා 1510 බස්, අශෝක් ලේලන්ඩ්, , ඉසුසු ජර්නි |
| වතුර බවුසර් | - | අශෝක් ලේලන්ඩ්/කාගෝ වතුර බවුසර්, ටාටා |
| ගලි රථ | - | ඉසුසු FXR බිඑම්සි, නිසාන් |
| කැබ්රථ | - | නිශාන් මිට්ෂුබිසි L 200, ඉසුසු , ටාටා සිංගල් කැබ්, |
| වෑන්රථ | - | මි/බි L 300, මැස්ඩා බොන්ගෝ, ඉසුසු පාගෝ, ටොයෝටා හයිඒස්, |
| කාර් | - | නිසාන් සනි බී 14, ටොයෝටා කොරොල්ලා, පර්ජෝ 406 |
| ජිප්රථ | - | ටොයෝටා ලෑන්ඩ් කෲෂර්, ලෑන්ඩ් රෝවර් ඩිෆෙන්ඩර්, මරුටි සුසුකි , මිට්ෂුබිසි පෙජරෝ |
| ට්‍රැක්ටර් | - | ෆෝඩ්, එච්එම්ටි, අයිඑම්ටි, මැසිෆර්ගියුෂන් 240, මහේන්ද්‍රන්, ස්කොට්, ටැෆේ, ෆියට්, ඉටැම්කෝ |
| අත් ට්‍රැක්ටර් | - | එම් 7, කුබෝටා, කුම්ජේ |
| වතුර ට්‍රේලර් | - | ගැලුන් 200, 800, 1000 |
| ත්‍රිවිලර් | - | බජාජ් |
| ටිපර් රථ | - | පුසෝ, ටාටා 1210 |
| ධා/පැදි | - | සුසුකි, යමහා , කවසාකි , හිරෝ හොන්ඩා , හයිසුන් ඩේලින්, TVX , හොණ්ඩා |
| ට්‍රැක්ටර් ට්‍රේලර් | - | ටොන් 3 ½ |
| අත් ට්‍රැක්ටර් ට්‍රේලර් | - | |
| සුන්බුන් වශයෙන් විකුණන රථ | - | ඇමරිකන් ට්‍රක්රථ, අයන් හෝස් රථ, යැන්ඇන් ට්‍රක්, බෆල්රථ, වතුර බවුසර්, ලෑන්ඩ් රෝවර් ඩිෆෙන්ඩර්, කැබ් රථ, ට්‍රැක්ටර්/අත්ට්‍රැක්ටර් ට්‍රේලර්, ත්‍රිවිලර්, අත් ට්‍රැක්ටර්, ධාවන පැදි, නිසාන් සිවිලියන් බස් රථ, අශෝක් ලේලන්ඩ් කන්ටේනර් ට්‍රේලර් |

**<u>පොදුභාණ්ඩ</u>**

**"සි" වාහන(ඩෝසර් රථ) අමතර කොටස්** - ඇලිස් චාමර් විවිධ, වැබ්කෝ විවිධ, මැක් විවිධ, ගැලියන් විවිධ, කමින්ස් විවිධ, නිසාන් විවිධ, ෆෝර්ඩ් 5000 විවිධ, පා/නු අමතර කොටස්(ෆිල්ටර්, රේඩියේටර්, ස්ලිව්,පිෂ්ටන්, පැකින්, ක්ලච් ප්ලේට්, හෝස්)

**භාවිතා නොකරන ලද යාන්ත්‍රික ප්‍රවාහන අමතර කොටස් - <u>(මෙම යාන්ත්‍රික ප්‍රවාහන අමතර කොටස් 3 වන යුධෝපකරණ බළකාය - මින්නේරිය පමණි)</u>** බ්‍රේක් බුස්ටර්, බෙයාරින් විවිධ, බෝල ජොයින්ට් විවිධ, බෙල් ක්‍රැන්ක්/ක්‍රැන්ක් ශාෆ්ට්, රෝල ස්ටාටර් ගියර් ක්ලච්, වොෂර් විවිධ, ස්ප්‍රින් විවිධ, ඉන්ලට් වැල් විවිධ, ෂූ රියර් මේන්, හැඩල් ඇසේ ප්‍රන්ට්, වොටර් පම්ප්, ස්ටීරියන් ශාෆ්ට් විවිධ, ඔල්ටනේටර් රෙක්ටිෆයර්, විල් නට්, වෛපර් ආම් විත් බ්ලේඩ්, වෛපර් මෝටර්, සෙන්ට්‍රබෝල්ට්, පින් වර්ග විවිධ, හෙඩ් ලයිට් කවුලින් හා පාවිච්චියට නුසුදුසු විවිධ වර්ගයන්ගෙන් යුත් අබලි යාන්ත්‍රික ප්‍රවාහන අමතර කොටස්, කාර්යාල උපකරණ, බැරැක්ක භාණ්ඩ, ටයර්/ටියුබ් සහ රබර් ආශ්‍රිත දෑ, බැටරි, බෝට්ටු එන්ජින්, අබලි යකඩ

**<u>ටෙන්ඩර් පිළිබඳ විස්තර හා ඒ වෙනුවෙන් අදාලවන ටෙන්ඩර් කොන්දේසි පහත දක්වා ඇත.</u>**

1. ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන ටෙන්ඩර්කරුවන් හට පහත දක්වා ඇති කාලසීමාවන් තුලදී මෙම අයෝග්‍යකරන ලද රථවාහන/පොදුභාණ්ඩ පරීක්ෂාකර බැලීමෙන් අනතුරුව ටෙන්ඩර්පත් ලබාගත හැක. (සතිඅන්ත දින හා රජයේ නිවාඩු දින හැර) **<u>මේ සඳහා කොන්ත්‍රාත් පැහැරහැර ලේඛණගතකර ඇති ගැණුම්කරුවන් හට ඉදිරිපත්විය නොහැක.</u>**

## <u>රථවාහන/පොදුභාණ්ඩ</u>

| <u>ස්ථානය</u> | <u>පරීක්ෂා කලහැකි කාලසීමාව</u> | | <u>ටෙන්ඩර්පත් ලබාගත හැකි කාලසීමාව</u> | |
|---|---|---|---|---|
| අ. 1 රෙජි යුධෝපකරණ බළකාය<br>යුද්ධ හමුදා ජනපදය,පනාගොඩ,හෝමාගම | 2011.12.26<br>2011.12.30 | දින 0830 පැයේ සිට<br>දින 1630 පැය දක්වා. | 2011.12.26<br>2012.01.09 | දින 0900 පැයේ සිට<br>දින 1500 පැය දක්වා. |
| ආ. ශ්‍රීලංඉ ස්වාධීන වැඩපල<br>යුද්ධ හමුදා කඳවුර, මත්තේගොඩ | 2011.12.26<br>2011.12.30 | දින 0830 පැයේ සිට<br>දින 1630 පැය දක්වා. | 2011.12.26<br>2012.01.09 | දින 0900 පැයේ සිට<br>දින 1500 පැය දක්වා. |
| ඇ. 2 රෙජි යුධෝපකරණ බළකාය<br>යුද්ධ හමුදා කඳවුර,රණසේවාපුර,අනුරාධපුර | 2012.01.02<br>2012.01.06 | දින 0830 පැයේ සිට<br>දින 1630 පැය දක්වා. | 2012.01.02<br>2012.01.15 | දින 0900 පැයේ සිට<br>දින 1500 පැය දක්වා |
| ඈ. 3 රෙජි යුධෝපකරණ බළකාය<br>යුද්ධ හමුදා කඳවුර,මහසෙන්පුර,මින්නේරිය | 2012.01.09<br>2012.01.13 | දින 0830 පැයේ සිට<br>දින 1630 පැය දක්වා. | 2012.01.09<br>2012.01.17 | දින 0900 පැයේ සිට<br>දින 1500 පැය දක්වා |
| ඉ. 5 රෙජි යුධෝපකරණ බළකාය<br>යුද්ධ හමුදා කඳවුර, කන්කසන්තුරය | 2012.01.16<br>2012.01.20 | දින 0830 පැයේ සිට<br>දින 1630 පැය දක්වා. | 2012.01.16<br>2012.01.23 | දින 0900 පැයේ සිට<br>දින 1500 පැය දක්වා |

2. මෙම අයෝග්‍ය කරන ලද වාහන/පොදුභාණ්ඩ ඉහත දක්වා ඇති කාලසීමාවේදි පරීක්ෂා කිරීමෙන් අනතුරුව ගැණුම්කරුවන් විසින් ඉදිරිපත්කල යුතු ටෙන්ඩර් ඉල්ලුම්පත් වාහන/පොදුභාණ්ඩ එක්රැස්කර ඇති භූමියේ ස්ථාපිතකර ඇති කාර්යාලයෙන් මිළදිගත හැක. ටෙන්ඩර් ඉල්ලුම්පත් ලබාගැනිම සඳහා **<u>එක් ලොට් එකක් වෙනුවෙන් ආපසු නොගෙවනු ලබන රුː 500/= (රුපියල් පන්සියයක) මුදලක්</u>** අයකරන අතර එම මුදල එම ස්ථානයේ සිටින මුදල් අයකැමි වෙත ගෙවීමෙන් පසු ලැබෙන කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් අවශ්‍ය ටෙන්ඩර්පත් ලබාගත හැක. **<u>එක් ගැණුම්කරුවෙකු ලොට් කිහිපයකට මිළගණන් ඉදිරිපත් කරන්නේනම් ඒ සඳහා වෙන වෙනම ටෙන්ඩර්පත් රුː 500/= බැගින් ගෙවා මිළදිගත යුතුය. එක් ටෙන්ඩර් පතකින් ඉදිරිපත්කල හැක්කේ එක් ලොට් එකකට අදාල මිළගණන් පමණක් වන අතර එසේ නොතිබුනහොත් එම ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.</u>**

3. මෙහි පහත සඳහන් පරිදි **<u>ආපසු ගෙවනු ලබන ඇපකරයක් සෑම වාහන/පොදුභාණ්ඩ ලොට් එකක් සඳහාම වෙන් වෙන් වශයෙන් ඉදිරිපත්කල යුතු අතර එම මුදල එම ස්ථානයේ සිටින මුදල් අයකැමි වෙත ගෙවීමෙන් පසු ලැබෙන කුවිතාන්සිය (මුල් පිටපත) අදාල ටෙන්ඩර්පත සමග අනිවාර්යයෙන්ම</u>** ඉදිරිපත්කල යුතුය. **<u>එම කුවිතාන්සිය ඉදිරිපත් නොකරන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.</u>** යම් ගැණුම්කරුවෙකු හට ටෙන්ඩරය ප්‍රදානය කිරීමෙන් පසු ඔහු/ඇය විසින් එම වාහන මිළදි ගැනිම ප්‍රතික්ෂප කරනු ලැබුවහොත් මෙම ඇප මුදල රාජසන්තක කරනු ලැබේ.

**<u>රථවාහන සඳහා ඉදිරිපත්කල යුතු ඇපමුදල් පහත සඳහන් පරිදි වේ</u>**

| | | | | | |
|---|---|---|---|---|---|
| ලෑන්ඩ් රෝවර් ඩිපෙන්ඩර්, ලෑන්ඩ් කෲෂර්, මිට්ෂුබිසි, මරුටි ජිප් වැනි සියළුම ජිප්රථ | රුː | 10000/= | ට්‍රැක්ටර් ට්‍රේලර්/වතුර ට්‍රේලර්/අත් ට්‍රැක්ටර් | රුː | 1000/= |
| සියළුම වර්ගයන්ට අයත් බරවාහන (ට්‍රක්, බස්, වතුර බවුසර්, ගලිරථ ආදි) | රුː | 10000/= | සුන්බුන් ලෙස ඉදිරිපත්කර ඇති (ඇමරිකන් ට්‍රක් රථ, බස් රථ, ජිප් රථ සහ යුනි බෆල් රථ, කාර්, වෑන්, කැබ්රථ) | රුː | 5000/= |
| ජිප්රථ නොවන අනෙකුත් සියළුම සැහැල්ලු වාහන (කාර්, වෑන්, කැබ්) | රුː | 7000/= | | | |
| ට්‍රැක්ටර් රථ | රුː | 3000/= | සුන්බුන් ලෙස වර්ගකර ඇති අනෙකුත් වාහන (ධාවන පැදි, ත්‍රිවිල් රථ, වතුර ට්‍රේලර්, අත් ට්‍රැක්ටර් ට්‍රේලර්, ට්‍රැක්ටර් ට්‍රේලර්) | රුː | 1000/= |
| ධාවන පැදි/ත්‍රිරෝද රථ සහ අත් ට්‍රැක්ටර් ට්‍රේලර් | රුː | 500/= | | | |

**<u>පොදුභාණ්ඩ සඳහා ඉදිරිපත්කල යුතු ඇප මුදල් පහත සඳහන් පරිදි වේ.</u>**

ලොට් එකක් සඳහා රු: 5000/=

4. විකිණීමට ඇති රථ වාහන/පොදුභාණ්ඩ වල සටහන්කර ඇති ලොට් අංකය ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරිමේදි **<u>අනිවාර්යයෙන්ම ටෙන්ඩර් පතෙහි හා ටෙන්ඩර් බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ</u>** පහත සඳහන් අයුරින් සඳහන්කල යුතුය.

**ලොට් අංකය:…………ටෙන්ඩර් විවෘත වන දිනය: 2012…………………..මස……………  දින වාහන/පොදුභාණ්ඩ වර්ගය**……………………………

5. ටෙන්ඩර් පෙට්ටි තබා ඇති ස්ථානය හා **<u>ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපෑලෙන් එවන්නේනම් එවිය යුතු ලිපිනය පහත දක්වා ඇත.</u>** රථවාහන/පොදුභාණ්ඩ සඳහා වෙන වෙනම ටෙන්ඩර් පෙට්ටි වෙන්කර තබා ඇති අතර එම ටෙන්ඩර් පෙට්ටි සතියේ වැඩකරන දිනවල (සතිඅන්ත හා රජයේ නිවාඩු දිනවල හැර) උදෑසන 0900 පැයේ සිට 1630 පැය දක්වා නියෝජිතයෙකු භාරයේ දක්වා ඇති ස්ථානයේ තබා ඇත. **<u>ටෙන්ඩර්පත් එම පෙට්ටිවල බහාලිමට ප්‍රථම එම ස්ථානයේ සිටින නියෝජිත භාරයේ තබා ඇති ලේඛණයේ ලේඛණගත කර ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.</u>**

| | **<u>ස්ථානය</u>** | **<u>ටෙන්ඩර් පෙට්ටි තබා ඇති ස්ථානය</u>** | **<u>ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ලිපිනය</u>** |
|---|---|---|---|
| අ. | 1 රෙජි යුධෝපකරණ බළකාය | ආරක්‍ෂක සේනා මූලස්ථානය - (දකුණ)<br>යුද්ධ හමුදා ජනපදය, පනාගොඩ, හෝමාගම ප්‍රධාන දොරටුව අසල | ටෙන්ඩර් මණ්ඩල සභාපති, 1 රෙජි යුධෝපකරණ බළකාය<br>යුද්ධ හමුදා ජනපදය, පනාගොඩ, හෝමාගම |
| ආ. | ශ්‍රීලංඉ ස්වාධීන වැඩපල මත්තේගොඩ | ශ්‍රීලංඉ ස්වාධීන වැඩපල<br>යුද්ධ හමුදා කඳවුර, මත්තේගොඩ ප්‍රධාන දෙරටුව අසල | ටෙන්ඩර් මණ්ඩල සභාපති, ශ්‍රීලංඉ ස්වාධීන වැඩපල<br>යුද්ධ හමුදා කඳවුර, මත්තේගොඩ |
| ඇ. | 2 රෙජි යුධෝපකරණ බළකාය | ආරක්‍ෂක සේනා මූලස්ථානය - (වන්නි)<br>යුද්ධ හමුදා කදවුර, රණසේවාපුර, අනුරාධපුර ප්‍රධාන දොරටුව අසල | ටෙන්ඩර් මණ්ඩල සභාපති, 2 රෙජි යුධෝපකරණ බළකාය<br>යුද්ධ හමුදා කදවුර, රණසේවාපුර, අනුරාධපුර |
| ඈ. | 3 රෙජි යුධෝපකරණ බළකාය | ආරක්‍ෂක සේනා මූලස්ථානය - (නැගෙනහිර)<br>යුද්ධ හමුදා කදවුර, මහසෙන්පුර, මින්නේරිය ප්‍රධාන දොරටුව අසල | ටෙන්ඩර් මණ්ඩල සභාපති, 3 රෙජි යුධෝපකරණ බළකාය<br>යුද්ධ හමුදා කදවුර, මහසෙන්පුර, මින්නේරිය |
| ඉ. | 5 රෙජි යුධෝපකරණ බළකාය | ආරක්‍ෂක සේනා මූලස්ථානය - (උතුර)<br>යුද්ධ හමුදා පොලිස් මාර්ග බාධකය, මාවඩිපුරම්, තෙලිප්පලෙයි යාපනය. අසල | ටෙන්ඩර් මණ්ඩල සභාපති, 5 රෙජි යුධෝපකරණ බළකාය<br>යුද්ධ හමුදා කදවුර, කන්කසන්තුරය |

6. සෑම ටෙන්ඩර් පතක්ම නිසි අයුරු යතුරු ලියනය කර කවරයක බහා මුද්‍රා තබා ඉහත දක්වා ඇති ස්ථානයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටිවලට පහත දක්වා ඇති දින හා වේලාවට ප්‍රථම පුද්ගලිකව බහාලිමට/ලියාපදිංචි තැපෑලෙන් එවිමට කටයුතුකල යුතුය. **<u>ටෙන්ඩර්පත් භාරගන්නා අවසාන දිනය හා වේලාව පහත 7 වන ජේදයේ සඳහන්කර ඇති පරිදිවන අතර ප්‍රමාදවී ලැබෙන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ</u>**.

7. ටෙන්ඩර්පත් විවෘත කිරිම පහත දක්වා ඇති ස්ථානවලදි දක්වා ඇති දින/වේලාවන්හිදි සිදුකෙරේ. **<u>ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාව සඳහා අනන්‍යතාව සහතිකල හැකි ජා:හැ:පත/ගමන් බලපත්‍රය/රියදුරු බලපත්‍රය සහිතව ගැණුම්කරු හෝ ගැණුම්කරු සහභාගි නොවන්නේනම් ඔහු වෙනුවට බලය පවරන ලද නිත්‍යානුකූල ලිපියක් සහිතව නියෝජිතයෙකු අනිවාර්යයෙන්ම සහභාගි කරවිමට</u>** ක්‍රියාකල යුතුය.

| **<u>රථවාහන/පොදුභාණ්ඩ සඳහා ලොට් අංක</u>** | **<u>ටෙන්ඩර් විවෘත කරනු ලබන ස්ථානය</u>** | **<u>ටෙන්ඩර් ඉදිරිපත්කල හැකි කාලසීමාව</u>** | **<u>ටෙන්ඩර් විවෘත කරනු ලබන දිනය හා වේලාව</u>** |
|---|---|---|---|
| 01 සිට 60 දක්වා(වාහන)<br>01 සිට 20 දක්වා(පොදුභාණ්ඩ) | 1 රෙජි යුධෝපකරණ බලකාය<br>යුද හමුදා ජනපදය,පනාගොඩ,හෝමාගම | 2011.12.26 දින 0900 පැයේ සිට<br>2012.01.10 දින 1000 පැය දක්වා | **<u>2012. 01 .10 දින 1030 පැයට</u>** |
| 61 සිට 143 දක්වා(වාහන) | 1 රෙජි යුධෝපකරණ බලකාය<br>යුද්ධ හමුදා ජනපදය, පනාගොඩ, හෝමාගම | 2011. 12 .26 දින 0900 පැයේ සිට<br>2012. 01 .11 දින 1000 පැය දක්වා | **<u>20012. 01 .11 දින 1030 පැයට</u>** |
| 01 සිට 08 දක්වා පොදුභාණ්ඩ<br>(ශ්‍රීලංඉ මුලිකවැඩපළ - මත්තේගොඩ) | 1 රෙජි යුධෝපකරණ බලකාය<br>යුද හමුදා ජනපදය,පනාගොඩ, හෝමාගම | 2011.12 .26 දින 0900 පැයේ සිට<br>2012. 01.10 දින 1000 පැය දක්වා | **<u>2012. 01.10 දින 1030 පැයට</u>** |
| 01 සිට 60 දක්වා(වාහන)<br>01 සිට 16 දක්වා(පොදුභාණ්ඩ) | 2 රෙජි යුධෝපකරණ බලකාය<br>යුද හමුදා දවුර,රණසේවාපුර,අනුරාධපුර | 2012.01.02 දින 0900 පැයේ සිට<br>2012.01.16 දින 1000 පැය දක්වා | **<u>2012. 01 .16 දින 1030 පැයට</u>**<br>2011ග05ග18 දින 1000 පැය දක්වා |
| 61 සිට 138 දක්වා(වාහන) | 2 රෙජි යුධෝපකරණ බලකාය<br>යුද හමුදා දවුර,රණසේවාපුර,අනුරාධපුර | 2012.01.02 දින 0900 පැයේ සිට<br>2012.01.17 දින 1000 පැය දක්වා | **<u>2012. 01 .17 දින 1030 පැයට</u>** |
| 01 සිට 46 දක්වා(වාහන)<br>01 සිට 20 දක්වා(පොදුභාණ්ඩ) | 3 රෙජි යුධෝපකරණ බලකාය<br>යුද හමුදා කදවුර,මහසෙන්පුර,මින්නේරිය | 2012.01.09 දින 0900 පැයේ සිට<br>2012.01.18 දින 1000 පැය දක්වා | **<u>2011. 01.18 දින 1030 පැයට</u>** |
| 01 සිට 58 දක්වා(වාහන)<br>සිට 19 දක්වා(පොදුභාණ්ඩ) | 5 රෙජි යුධෝපකරණ බලකාය<br>යුධ හමුදා කඳවුර, කන්කසන්තුරය | 2012.01.16 දින 0900 පැයේ සිට<br>2012.01.24 දින 1000 පැය දක්වා | **<u>2012.01. 24 දින 1030 පැයට</u>** 01 |

8. ඉහත දක්වා ඇති වේලාවන්හිදි ටෙන්ඩර්පත් විවෘත කිරිමෙන් අනතුරුව **<u>එම අවස්ථාවේදිම එක් එක් ලොට් අංකය වෙනුවෙන් උපරිම මිළ ඉදිරිපත්කර ඇති ටෙන්ඩර්කරු හා මුදල ප්‍රකාශයට පත්කල විගස එම ටෙන්ඩර්කරු හෝ ඉහත 7 වන ජේදයේ දක්වා ඇති ඔහු විසින් බලය පවරන ලද නියෝජිත විසින් එම ටෙන්ඩර් මුදලින් 25 % ක ප්‍රමාණයක් එම අවස්ථාවේදිම ගෙවිය යුතුය</u>**. ටෙන්ඩර් විවෘත කිරිමට සහභාගිවන **<u>ගැණුම්කරුවන් හෝ නියෝජිතයින් ඒ ඒ ලොට් අංක වෙනුවෙන් ටෙන්ඩර් ප්‍රදානය කරනු ලැබුවහොත් ඒ ඒ ලොට් වෙනුවෙන් තැන්පත් කලයුතු 25% ක මුදල ඒ අවස්ථාවේදිම ගෙවිම සඳහා ප්‍රමාණවත් තරම් මුදල් අනිවාර්යයෙන්ම රැගෙන ආයුතු අතර ඒ සඳහා අමතර කල්ලබාදිමක් සිදු නොකෙරේ.</u>** මේ සඳහා ප්‍රේෂණපත් භාර නොගන්නා අතර ඉතිරි සම්පූර්ණ මුදලද එදින හෝ ටෙන්ඩර් පැවති දිනයේ සිට (එදින හැර) වැඩකරන දින 07 ක් අවසානවිමට ප්‍රථම (හත්වන දින 1600 පැයට ප්‍රථම) මුදලින් ගෙවිය යුතුය. 25% මුදලක් ගෙවිමෙන් අනතුරුව දින 07 ක් ඇතුළත ඉතිරි 75% මුදල නිරවුල්කර අදාල වාහන හෝ පොදුභාණ්ඩ රැගෙන යා යුතුය. එම කාලසීමාවට ප්‍රථම අදාල වාහන/පොදුභාණ්ඩ රැගෙන යනු නොලැබුහොත් කිසිම දැනුම්දිමකින් තොරව එම වාහන හෝ පොදුභාණ්ඩ සඳහා ගෙවා ඇති 25% මුදල සහ තැන්පත් කර ඇති ඇප මුදල රාජසන්තක කිරිමේ බලය ටෙන්ඩර් මණ්ඩලය සතුව ඇත.

9. **<u>යම් ලොට් අංකයක් වෙනුවෙන් උපරිම මිළ ඉදිරිපත්කර තිබුණද ඉහත 7 ජේදයේ දක්වා ඇති පරිදි ටෙන්ඩර්පත් විවෘත කරන දින නියමිත වේලාවට හෝ උපරිම වශයෙන් ටෙන්ඩරය විවෘත කරනු ලබන දිනයේ 1300 පැය වන විට ටෙන්ඩරය පවත්වන භූමියට පැමිණ නොසිටින ටෙන්ඩර්කරුවන් තැන්පත්කර ඇති ඇපමුදල් එම අවස්ථාවේදිම රාජසන්තක කිරිමට කටයුතු කරනු ඇත.</u>** එසේ උපරිම මිළ ඉදිරිපත්කර ඇති ටෙන්ඩර්කරු හෝ බලයලත් නියෝජිත ඉහත සඳහන් නියමිත කාලසීමාව තුලදි නොපැමිණ සිටින ලොට් අංක වෙනුවෙන් ඔවුන්ගේ ඇපමුදල් රාජසන්තක කිරිමෙන් අනතුරුව එම ලොට් අංක තාවකාලිකව ටෙන්ඩරයෙන් ඉවත්කරනු ඇත. එවැනි අවස්ථාවකදි ඉදිරිපත්ව තිබු උපරිම මිළ, ඊළඟ උපරිම මිළ අතර පරතරය හා තක්සේරු මිළ අනුව එම ලොට් නැවත ටෙන්ඩරයට ඉදිරිපත්කර ඊළඟ උපරිම මිළ ඉදිරිපත්කර ඇති ටෙන්ඩර්කරුට එය ප්‍රදානය කරන්නේද නැතහොත් ස්ථිරවම ටෙන්ඩරයෙන් ඉවත් කරන්නේද යන්න පිළිබඳ අවසාන තිරණය ටෙන්ඩර් මණ්ඩල සභාපති සතුවේ.

10. මෙම ටෙන්ඩර් සැබඳිව ඉහත සඳහන් කොන්දේසි හා ටෙන්ඩර්පත්වල දක්වා ඇති කොන්දේසි හොඳින් කියවා බලා තේරුම්ගෙන ඒවාට අනුකූලව ටෙන්ඩර්පත් ඉදිරිපත්කිරිම හා ක්‍රියාකිරිම ටෙන්ඩර්කරුවන් සතු වගකිම බව අවධාරණය කරන අතර ටෙන්ඩර් පිළිබඳ අවසාන තිරණය ටෙන්ඩර් මණ්ඩල සභාපති සතුවේ.

11. මේ පිළිබඳ වැඩි විස්තර යුද්ධ හමුදා මූලස්ථානයේ දුරකථන අංක: 0112-448079 වෙතින් හා යුද්ධ හමුදා වෙබ් අඩවියෙන් (www.army.lk) ලබාගත හැක.

**යුද්ධ හමුදාධිපති**